Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සතිපාසල

විෂය - නාට්‍ය හා රංග කලාව

කායී පත්‍රිකා - 01

12 ශ්‍රේණිය - තෙවන වාරය

සැකසුම - තරංගා D ගුණරත්න

නිපුණතාවය 3.3 : චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරයි.

පාඩම : ගුරුවරයා විසින් නම් කරනු ලබන චරිත හා අවස්ථා නිර්මාණය කිරීම.

ඉගැනුම් පල :

- චරිතයක් හෝ අවස්ථාවක් හෝ නිර්මාණයේ දී සලකා බැලිය යුතු මූලික කරුණු පිළිබඳ අවබෝධයක් ලබාගනියි.
- කිසියම් චරිතයක් හෝ සිදුවීමක් දෙස නව මානයකින් බැලීමටත්, නව අර්ථකථන සැපයීමටත් පෙලඹෙයි.
- අත්දැකීම් හා පරිකල්පනය භාවිතයෙන් දෙනු ලබන ඕනෑ ම චරිතයක් හෝ සිදුවීමක් හෝ අපූර්වත්වයකින් යුතු ව නිරූපණයට හැකියාව ලබාගනියි.
- කේවල මෙන් ම සාමූහික වශයෙන් චරිත හා අවස්ථා ප්‍රතිනිර්මාණය කරමින් ස්වයං ඇගැයීමක යෙදෙයි.

➢ ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්...

1) නරි බෑණා,සිංහබාහු,සෙල්ලම් ගෙදර,සකුන්තලා,ඊඩිපස්,කුවේණි,මනමේ නාට්‍ය පිටපත් කියවීමෙන් හා video නැරඹීමෙන් ඒවායේ චරිත හා අවස්ථා පිළිබඳ හොඳින් අධ්‍යනය කරන්න.
2) e-තක්සලාව,e-නැණ පියස,ගුරු ගෙදර,මුද්‍රිත පොත් පත් ආදී ඉගෙනුම් ආධාරක භාවිතා කර වැඩිදුර අධ්‍යනයේ යෙදෙන්න.
3) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්,websites,ඉගෙනුම් ආධාරක :-
   - ❖ සිංහබාහු - https://youtu.be/InhrCitmixs
   - ❖ මනමේ - https://youtu.be/wJ2Mi09hGuI
   - ❖ නරි බෑණා - https://youtu.be/sl_wCz4hoWI

➢ ඇගයීම

✓ නරිබෑණා නාට්‍යය ඇසුරෙන් - බල්ලාගෙන් බේරී පැන ආ නරියා
✓ සිංහබාහු නාට්‍යය ඇසුරෙන් - සිංහයා මරා දැමූ සිංහබාහ
✓ සෙල්ලම් ගෙදර ඇසුරෙන - නෝරා ගිය පසු හෙල්ම
✓ සකුන්තලා ඇසුරෙන් - සකුන්තලාට පුතකු ඉපදුණ දා
✓ ඊඩිපස් ඇසුරෙන් - මියගිය ඊඩිපස් හා ජොකස්ටා පරලොව දී හමු වීම
✓ කුවේණි හා මනමේ ඇසුරෙන් - මියගිය කුවේණියට පරලොවදී මනමේ කුමරු හමුවීම

1. ඒ ඒ මාතෘකාවට අනුකූලව තනි තනිව හෝ අවශ්‍ය පරිදි සාමූහිකව හෝ චරිත හා අවස්ථා නිර්මාණය කරන්න.

➢ පසු ක්‍රියාකාරකම්

1.පෙර ක්‍රියාකාරකමෙන් ලද අත්දැකීම් පාදක කොට ගනිමින් මාතෘකා වලට අදාල කෙටි නාට්‍යමය අවස්ථා රචනා කරන්න.